රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிர்வாக, உள்நாட்டலுவல்கள், மாகாண சபை மற்றும் உள்ளூராட்சிகள் அமைச்சு
Ministry of Public Administration, Home Affairs and Provincial Councils & Local Government
ස්වදේශ කටයුතු අංශය (දිස්ත්‍රික් පාලන) | உள்நாட்டலுவல்கள் பிரிவு (மாவட்ட நிர்வாகப்) | Home Affairs Division (District Administration)

මගේ අංකය / எனது இல / My No: HA/01/07/01
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2020.04. 28

සියලුම දිස්ත්‍රික් ලේකම්වරු
සියලුම ප්‍රාදේශීය ලේකම්වරු

<u>කොවිඩ් -19 වෛරස ව්‍යාප්තිය පාලනය කිරීම හා අත්‍යවශ්‍ය සේවා සැපයීම් අඛණ්ඩව පවත්වාගෙන යාම</u>

මගේ සමාංක දරන 2020-04-03 හා 2020-04-04 දරන ලිපි වලට අමතරවයි.

02. එම ලිපිවල උපදෙස් පරිදි කොළඹ, කුරුණෑගල, පුත්තලම, පොළොන්නරුව හා බදුල්ල යන දිස්ත්‍රික් ලේකම්වරු එම උපදෙස් අනුව කටයුතු කිරීම පිලිබඳ මාගේ කෘතඥතාව පිරිනමමි.

03. මේ පිළිබඳව ගරු අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි පහත කරුණු දැනුම් දෙමි.

04. මේ වන විට ඔබට කොවිඩ් -19 මර්ධනය සඳහා ලබාදී ඇති ප්‍රතිපාදන වලින් හා මේ වනවිට ලබාදී ඇති සියලුම පුනරාවර්තන ප්‍රතිපාදන අතිරික්තයන් භාවිත කොට ග්‍රාම නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන් ,කාර්යාලීය නිලධාරීන් හා සියලුම මාණ්ඩලික නිලධාරීන් ඇතුළු කොවිඩ් -19 වෛරසය හේතුවෙන් ජන ජීවිතය බිඳ වැටීමට ඉඩ නොතබා දිවා රාත්‍රී නොතකා ජනතා සේවයේ නිරත වූ සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ රාජකාරි වියදම් ප්‍රතිපූර්ණය කර දීමට කටයුතු කරන ලෙස නැවත දන්වමි.

05. මීට අමතරව මෙම ආපදා රාජකාරි වල නිරත වූ සියලුම නිලධාරීන් සඳහා දිරිගැන්වීමේ දීමනාවක් ලබාදීමට ගරු අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ද ම විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් සිටී.

06. ඒට අමතරව ග්‍රාම නිලධාරීන් හට 2020 මාර්තු 15 වන දින සිට ජූනි මස 15 දක්වා පහත පරිදි ගෙවීම් කරන ලෙසත්,ඒ සඳහා දැනට ලබා දී ඇති ප්‍රතිපාදන මත කලමනාකරණය කරගන්නා ලෙසද මෙයින් තවදුරටත් දන්වා සිටිමි.

i. ග්‍රාම නිලධාරීන් හට ඉන්ධන දීමනාව: එක් මසකට රුපියල් 450 ක් බැගින්ද, වැඩ බැලීමක් සිදු කරන්නේ නම් රුපියල් 600 දක්වා එම දීමනාව වැඩි කර ලබා දීම.
ii. මා විසින් අනුමත කර ඇති සන්නිවේදන දීමනාව රුපියල් 600 සිට 1500 දක්වා වැඩි කර ලබා දීම
iii. වසම තුල රාජකාරි සඳහා ගෙවනු ලබන ගමන් වියදම් දීමනාව රුපියල් 600 සිට රුපියල් 1200 දක්වා වැඩිකර ගෙවීම

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත්
1. විගණකාධිපති- කරු. දැ.ග.ස.
2. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අයවැය දෙපාර්තමේන්තුව- කරු. දැ.ග.ස .
3. අධ්‍යක්ෂ ජනරාල් - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව- කරු. දැ.ග.ස
4. සියලුම ප්‍රධාන ගණකාධිකාරීවරුන් - දිස්ත්‍රික් ලේකම් කාර්යාල- කරු. අ.ක.ස.

රාජ්‍ය පරිපාලන අංශය
பொது நிர்வாக பிரிவு
Public Administration Division
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.
சுதந்திர சதுக்கம், கொழும்பு 07.
Independance Square, Colombo 07.

ස්වදේශ කටයුතු අංශය
உள்நாட்டலுவல்கள் பிரிவு
Home Affairs Division
"නිල මැදුර", ඇල්විටිගල මාවත, කොළඹ 05.
"நில மெதுர", எல்விடிகல மாவத்தை, கொழும்பு 05.
"Nila Madura", Elvitigala Mawatha, Colombo 05.

පළාත් සභා හා පළාත් පාලන අංශය
மாகாண சபை மற்றும் உள்ளூராட்சிகள் பிரிவு
Provincial Councils & Local Government Division
330, යුනියන් පෙදෙස, කොළඹ 02.
330, யூனியன் பிளேஸ், கொழும்பு 02.
330, Union Place, Colombo 02.

Scanned with CamScanner